**We Deliver Results....**

**Susantha Katugampala**
Barrister & Solicitor
*Immigration Lawyer*
*Migration Agent Reg: 96/86306*

**FAIRFIELDS**
**IMMIGRATION LAWYERS - MELBOURNE**

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002

නායක සෝමවංශ අමරසිංහ මහතාගේ අදහස වූයේ, මෙම සර්ව පාක්ෂික සමුළුව, 2005 නොවැම්බර් 17 දා පැවති ජනාධිපතිවරණයෙන් ජනවරම ලැබූ මහින්ද චින්තන අභිප්‍රායන් යටපත් කිරීම සඳහා කටයුතු නොකළයුතු බවය. ජනවරම කුමක්ද යන්න මහින්ද චින්තනයේ ඉතාමත් පැහැදිලිව සඳහන්ව තිබෙන බවද ඔහු පැවසීය. තවද දේශපාලන විසඳුමක් සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ සාකච්ඡා අරඹන්නේ නම් එහිදී එම සංවිධානය නිරායුධ කිරීමේ අරමුණද ඇතුව ඒ සඳහා ද ප්‍රමුඛත්වයක් ලබා දෙමින් එම සාකච්ඡා ඉදිරියට ගෙන යා යුතු බවද හෙතෙම පැහැදිලි කළේය.
ජාතික හෙළ උරුමය වෙනුවෙන් එහිදී අදහස් දැක්වූ එම පක්ෂ නායක එල්ලාවල මේධානන්ද හිමියෝ පසුගිය ජනාධිපතිවරණයේදී පෙඩරල් බිල්ලාව ප්‍රායෝගිකව පරාජයට පත් කළ බවත් එසේ වුවද එය නැවතත් හිස ඔසවමින් පවතින බැවින් එය මතවාදී තලයේදී පරාජයට පත් කිරීමටද කටයුතු කළයුතුව ඇති බවත් එහිදී අවධාරණය කර ඇත.

ජනවාර්ගික ප්‍රශ්නයට අවසන් දේශපාලන විසඳුමක් සොයා ගැනීම සම්බන්ධයෙන් තමා කටයුතු කිරීමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඉතා පැහැදිලිව සිය අදහස පළ කර ඇත. සියළු අදහස්වලට ඇහුම්කන් දුන් ජනාධිපතිවරයා කවර පක්ෂයක් කුමන ස්ථාවරයක සිටියද තමා බලාපොරොත්තු වන විසඳුමේ ස්වභාවයත් එය ඉටුකර ගැනීමට අනුගමනය කරන ක්‍රමවේදයත් ඉතා පැහැදිලිව හෙළි දක්වා ඇත.

සමුළුවේ සිටි පක්ෂවලද ජනාධිපතිවරයාගේ ක්‍රමවේදයේ ගැටළුවක් ඇති බව සඳහන් නොකරති. වඩාත් පුළුල් සහභාගීත්ව ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ජනාධිපතිවරයා පියවර ගෙන ඇත. වෙනස් ස්ථවරයන් දරණ දේශපාලන පක්ෂ උද්ඝෝෂණ වේදිකාවලට හෝ සටන් පාඨ සමඟ මහමගට ඇද නොදමා සියළු අදහස් හා මතවාදයන් පළ කිරීම සඳහා ජනාධිපතිවරයා සියළු පාර්ෂවයන්ට ගෞරවනීය විවෘත වේදිකාවක් සකසා දී ඇත. එහිදී වගකීම් සහගතව කටයුතු කිරීම සඳහා සියළු පාර්ශවයන්ට හා දේශපාලන පක්ෂ සඳහා නිරායාස සමාජ බලපෑමක් එල්ලවීමද වැලැක්විය නොහැකි කාරණයකි.

ජනාධිපතිවරයා කියන්නේ කුමක්දැයි සංයුක්තව විමසා බැලීමද වටී. ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සෙවීම සඳහා හෙතෙම සියළු දේශපාලන පක්ෂවල නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. ඊට සමගාමීව එම කමිටුවට උපදෙස් ලබා ගැනීම සඳහා විශේෂඥයන්ගෙන් සමන්විත කමිටුවක්ද පිහිටුවයි. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පැවැති අවසන් සර්ව පාක්ෂික සමුළුවේදී පැවසූ ආකාරයට ව්‍යාවස්ථා සම්පාදක කමිටුව තෝරා පත්කර ගැනීම සිදුවන්නේ එම සර්ව පාක්ෂික කමිටුවේ අනුමැතිය අනුවය. බොහෝ මත එක්තැන් කර ගනිමින් බොහෝ බලවේග එක්කර ගනිමින් කටයුතු කිරීමේදී ඇතිවන ගැටළු හා බාධකද බොහෝය. එසේ වූ පමණින් එම ප්‍රවේශය අත්හළයුතු නැත. කවුරුන් කෙසේ සාකච්ඡා කළද රටේ අනාගත පැවැත්මට පවා බලපාන මෙවන් තීරණාත්මක ප්‍රශ්නයකට විසඳුම් සොයා ගැනීම හෝ නොගැනීම තීරණය වන්නේ උතුරෙත් දකුණෙත් දේශපාලන බලවේග කොතෙක් දුරට පරිත්‍යාග කිරීමට සූදානම් වන්නේද කොතෙක් දුරට නම්‍යශීලි හා ප්‍රායෝගික වන්නේද යන්න මතය.
එහිදී එල්.ටී.ටී.ඊ. සංවිධාන වැනි ත්‍රස්තවාදය උත්සන්න කරන මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කරන සන්නද්ධ සංවිධානයක් සමග කටයුතු කළයුතු හා කරන ක්‍රමවේදයන් සම්බන්ධයෙන් ද විවිධ මත පැවතිය හැකිය. යුරෝපා සංගමයේ තහනම ඇතුළුව එම තත්ත්වයන්ට මුහුණදීම සඳහා භාවිතා කළයුතු ජාත්‍යන්තර මෙන්ම දේශීය බලවේග සූක්ෂමව උපයෝගී කර ගැනීම රජය ඇතුළු දකුණේ දේශපාලන බලවේගවල වගකීමද වේ. ඉන්දීය රජය සංයුක්ත වන පරස්පර දේශපාලන බලවේග හා ඔවුන් එම බලවේග කළමණාකරණය කර ගන්නා ආකාරය අපට කදිම ආදර්ශයකි.

■

කාරෙක කැඩිලා පාරෙ රස්තියාදු වුණ කාලෙ
දැන් ඉවරයි
ශ්‍රී ලංකාවට අලුතින් අඳුන්වා දෙන වාහන ආපදා සේවය
**Road Service Lanka Pvt Ltd**

කොළඹ සහ තදාසන්න ප්‍රදේශ වල වාහන හිමියන් වෙනුවෙන්
පැය විසි හතරම සේවයට
අපේ ආපදා සේවයේ සාමාජිකත්වය ගන්නා සැමට

නොමිලේ සේවා වාර දෙකක්
නොමිලේ එක් ඇදගෙන යාමක්



ශ්‍රී ලංකාවේ ඔබේ ඥාතියාට/හිතවතාට තෑග්ගක් ලෙස
අපේ වාහන ආපදා සේවයේ සාමාජිකත්වය ලබා දෙන්නට
දැන් ඔබට පුලුවන්

විමසන්න
ඔස්ට්‍රේලියාවේදී
0414 189 384

ශ්‍රී ලංකාවේ දී
ධනංජය
071 680 29 22
060 21 41 400



**Road Service Lanka Pvt Ltd**